# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 18 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 20 යි — තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 18 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 69/80.

**බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 18 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**2.** බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 12 වන වගන්තියෙහි අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

318 වන අධිකාරයෙහි 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුව ද—

(අ) දියවඩන නිලමේවරයකුගේ ධුර කාලය අවුරුදු දහයක් විය යුතු ය ; තව ද,

(ආ) බස්නායක නිලමේවරයකුගේ ධුර කාලය දීර්ඝ කිරීම විහාරයක දේපළ කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා හිතකර වේ යයි ජනාධිපතිවරයා විසින් සලකනු ලබන්නේ නම් ජනාධිපතිවරයා විසින් බස්නායක නිලමේවරයකුගේ ධුර කාලය එක් වරකට අවුරුද්ද බැගින් වූ කාලයකට දීර්ඝ කරනු ලැබිය හැකි ය. එහෙත් එසේ දීර්ඝ කරනු ලබන කාලවල සමස්තය අවුරුදු දෙකක් නොඉක්මවිය යුතු ය.".

**3.** නියමිත දිනට පෙරාතුව ම වූ දිනයෙහි ධුරය දරමින් සිටි සෑම බස්නායක නිලමේවරයකු ම—

ධුරය දරන බස්නායක නිලමේවරුන්ට 12 වන වගන්තියෙහි සංශෝධනය අදාළ වීම.

(අ) නියමිත දිනට අවුරුදු පහක් හෝ ඊට වැඩි කාලයක් එම ධුරය දරා ඇති අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් ඔහුගේ ධුර කාලය දීර්ඝ කරනු ලැබ ඇත්නම් මිස, නියමිත දින සිට එක් සතියක කාලයක් ඉකුත්වීමෙන් පසු ඔහු එම ධුරය දැරීම නතර විය යුතු ය; තව ද

(ආ) ජනාධිපතිවරයා විසින් ඔහුගේ ධුර කාලය දීර්ඝ කරනු ලැබ ඇත්නම් මිස එම ධුරයට ඔහු පත් කරනු ලැබූ දිනයෙහි සිට අවුරුදු පහක කාලයක් සම්පූර්ණ කළ විට, එම ධුරය දැරීම නතර විය යුතු ය :

එසේ වුව ද ඒ තැනැත්තා ඒ ධුරය දැරීමේ අවුරුදු පහක කාලය නියමිත දින සිට එක් සතියක් ඇතුළත සම්පූර්ණ කළ අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් ඔහුගේ ධුර කාලය දීර්ඝ කරනු ලැබුවහොත් මිස, නියමිත දින සිට එක් සතියක කාලයක් ඉකුත් වූ විට ඔහු එම ධුරය දැරීම නතර විය යුතු ය.

ඒ 63874—11,500 (80/12)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.